වෙළුම 13 | කාණ්ඩය 02 | දෙසැම්බර් 2024

# පුවත් හසුන

උක් පර්යේෂණ ආයතනය

# උක් පර්යේෂණ ආයතනය කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතට

අමිල ප්‍රසාද් කරුණාතිලක



ගරු අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති මහතා



ගරු නියෝජ්‍ය අමාත්‍ය චතුරංග අබේසිංහ මහතා



අමාත්‍යාංශ ලේකම් තිලකා ජයසුන්දර මහත්මිය

උක් පර්යේෂණ ආයතනය, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්කර ඇත. එමෙන්ම සියලුම සීනි නිෂ්පාදන කර්මාන්තායතන ද මෙම අමාත්‍යාංශය යටතට ඇතුළත් කිරීමට පියවර ගෙන තිබේ. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති මහතා නව අමාත්‍යවරයා ලෙස ද නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී චතුරංග අබේසිංහ මහතා ද අමාත්‍යාංශ ලේකම් ලෙස තිලකා ජයසුන්දර මහත්මිය ද පත්කර ඇත. නව දිශානතියක් වෙත අමාත්‍යාංශය මෙහෙයවීමට ඔබ සැමට හැකි වේවායි පුවත් හසුනින් මෙසේ සුභාෂිංශන එක් කර සිටිමු.

# චීනයේ යුනාන් උක් පර්යේෂණ ආයතනයේ සහය ඉදිරියටත්

කේ. පී. වික්‍රමසිංහ - පර්යේෂණ නිලධාරී



චීනයේ යුනාන් උක් පර්යේෂණ ආයතනයේ පර්යේෂකයන් පිරිසක් පසුගියදා ශ්‍රී ලංකා උක් පර්යේෂණ ආයතනයේ තෙදින නිරීක්ෂණ චාරිකාවකට එක් විය. උක් පර්යේෂණ සංවර්ධනය සහ උක් කර්මාන්තයේ සංවර්ධනය උදෙසා දෙරට අතර සහයෝගීතාව වර්ධනය කර ගැනීම මෙම සංචාරයේ මූලික අරමුණයි. මේ සඳහා යුනාන් උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ Guo Jiawen මහතා, එහි අන්තර්ජාතික සම්බන්ධතා ඒකකයේ අංශ ප්‍රධානී, ආචාර්ය Zhaho Peifang ඇතුළු පර්යේෂකයන් කණ්ඩායමක් එක් විය. මෙහිදී උඩවලව උක් පර්යේෂණ ආයතනය මගින් දියත්කර ඇති පර්යේෂණ මෙන්ම ඉදිරි සහයෝගිතා වැඩසටහන් පිළිබඳව අවධානය යොමු කරන ලද අතරම, දෙණියාය එන්සල්වත්ත ප්‍රදේශයේ පිහිටි අභිජනන මධ්‍යස්ථානයේ මෙන්ම සෙවනගල ප්‍රදේශයේ උක් වගා ආශ්‍රිතව සිදු කරනු ලබන ක්‍රියාකාරකම් හා සීනි නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව ද නිරීක්ෂණ ලබා ගැනිණ. මෙම සහයෝගීතාව යටතේ උක් පර්යේෂණ ආයතනයේ නිලධාරීන් සඳහා දැනටමත් චීනයේ යුනාන් උක් පර්යේෂණ ආයතනයයේ කෙටි කාලීන මෙන්ම දිගු කාලීන පුහුණු අවස්ථා මෙන්ම සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීමට අවස්ථාවන් ද හිමි වී ඇත.

# උක් පර්යේෂණ ආයතනයට කෘෂිකාර්මික පර්යේෂණ විශිෂ්ඨතා සම්මානයක්



පර්යේෂක කණ්ඩායම විශිෂ්ඨතා සම්මානයන් අතැතිව

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් සංවිධානය කරන ලද "කෘෂිකාර්මික පර්යේෂණ විශිෂ්ඨත්වය සඳහා ජාතික සම්මාන උළෙලේ" දී..

03 පිටුවට

## ඇතුළු පිටු


- උක් පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින් චීනයේ ජාත්‍යන්තර සමුළුවකට සහභාගී වෙයි 02
- කාබනික පොහොර "පෙලට්" යොදනයෙන් වැඩගන්නා ගල්ඔය 02
- දේශීය සීනි කර්මාන්තය හා එහි අනාගතය 03
- උක් වගා තාක්ෂණයන් ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් රැසක් 04-05
- උක් වගාව උතුරට වැඩසටහන තවත් පියවරකින් ඉදිරියට 06
- චීන - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ ප්‍රකාශනයක් 07
- ඉතිහාසයේ දෙවන ඉහළම සීනි නිෂ්පාදනය 2024 වසරේ දී 07-08

# ශ්‍රී ලංකා උක් පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින් චීනයේ ජාත්‍යන්තර සමුළුවකට සහභාගී වෙයි




සමුළුවට සහභාගි වූ පර්යේෂකයන් කණ්ඩායම

දකුණු සහ අග්නිදිග ආසියානු රටවල උක් ජාන වැඩිදියුණු කිරීම පිළිබඳව චීනයේ යුනාන් උක් පර්යේෂණ ආයතනයේ පැවති අන්තර්ජාතික සමුළුවකට ශ්‍රී ලංකා උක් පර්යේෂණ ආයතනය නියෝජනය කරමින් විද්‍යාඥයින් පිරිසක් එක් විය. 2024 ඔක්තෝබර් 20 සිට 25 දක්වා චීනයේ දී පැවති මෙම සමුළුව සඳහා රටවල් 08ක පර්යේෂකයන් සහභාගි වීය. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ (වැ.බ.) ආචාර්ය චන්ද්‍රජිත් ද සිල්වා, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී සන්ධ්‍යා ආරියවංශ, බෝග වැඩිදියුණු කිරීමේ අංශයේ අංශ ප්‍රධානී මාලිකා පෙරේරා හා එම අංශයේ පර්යේෂණ නිලධාරී කමල් වික්‍රමසිංහ යන මහත්ම මහත්මීන් ද එක් විය.

උක් බෝගය වැඩිදියුණු කිරීමට ලෝකයේ අනෙකුත් රටවල් යොදාගන්නා නවීන තාක්ෂණික ක්‍රම සම්බන්ධයෙන් දැණුම ලබා ගැනීමටත්, ශ්‍රී ලංකාව තුළ භාවිතාකරන ක්‍රමවේදයන් පිළිබඳ අනෙකුත් රටවල්වල පර්යේෂකයන් දැනුවත් කිරීමටත් මෙහිදී අවස්ථාව උදා විය.

# කාබනික පොහොර "පෙලට්" යොදනයෙන් වැඩගන්නා ගල්ඔය

ඩබ්ලිව්. ජී. එම්. එස්. වේරගොඩ - සංවර්ධන නිලධාරී



වගාව ස්ථාපනය කරන අවස්ථාවේ දී කාබනික පොහොර පෙලට්/කැට යෙදීම



පැළ වගාවට කාබනික පොහොර පෙලට්/කැට යෙදීම

උක් පර්යේෂණ ආයතනයේ යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය විසින් නිර්මාණය කරන ලද කාබනික පොහොර පෙලට් යොදනය මේ වන විට ගල්ඔය වැවිලි සමාගම ඉතා සාර්ථකව භාවිතයට ගනිමින් ඇත. සිව්රෝද ට්‍රැක්ටරයට සවිකිරීමට හැකිවන ලෙස නිර්මාණය කර ඇති මෙම පෙලට් යොදනය, වර්තමානයේ ඇති උග්‍ර කම්කරු හිඟයට හා පිරිවැය ඉහළ යාමට විසඳුමක් සපයයි. එකවර උක් පෙළ තුනකට කාබනික පොහොර පෙලට් ලෙස යෙදීමට හැකියාව ඇති මෙමගින්, හෙක්ටයාරයකට නිර්දේශ කර ඇති ටොන් 2.5 ප්‍රමාණය පැය 04-05 කාලයක් තුළදී යෙදීමට හැකියාව ඇත. එමෙන්ම, වගාවට යොදන පොහොර නිර්දේශයන්ට අනුකූලව පෙලට් යොදනය ක්‍රමාංකනය කර ගැනීමට හැකියාව මෙහි ඇති තවත් විශේෂත්වයකි. මේ වන විට ගල්ඔය වැවිලි සමාගම විසින් නිපදවන කාබනික පෙලට් ක්ෂේත්‍රයට යෙදීමට මෙම යන්ත්‍රය භාවිතා කරයි. කාබනික පොහොර පෙලට් ලෙස පමණක් නොව කාබනික පොහොර පවතින ආකාරයෙන්ම ද ක්ෂේත්‍රයට යෙදීමට හැකිවන පරිදි වැඩිදියුණු කර ගොවිබිම් සඳහා භාවිතයට ලබා දීම මෙය නිර්මාණය කරන ලද යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශයේ ඉදිරි දැක්ම වේ.

# දේශීය සීනි කර්මාන්තය හා එහි අනාගතය



සුරත් පෙරේරා
ප්‍රධාන විධායක නිලධාරී
ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම

**සීනි කිලෝවක මිල (බදු රහිතව) රු. 250.00-275.00 සිට රු. 190.00-210.00 දක්වා අඩුවීමත්, ENA ලීටරයක මිල රු. 1,500.00 සිට රු. 450.00-550.00 දක්වා අඩුවීමත් හේතුවෙන් මේ වන විට දේශීය සීනි කර්මාන්තය බරපතල අර්බුදයකට මුහුණපා ඇත.**

මේ වන විට සීනි මිනිසාට අත්‍යවශ්‍ය ආහාරයක් බවට පත්ව ඇත. මේ හේතුව නිසාම ඒ සඳහා ඇති ඉල්ලුම වාර්ෂිකව ඉහළ යමින් පවතින අතර, ශ්‍රී ලංකාවේ ද ඒක පුද්ගල සීනි පරිභෝජනය කිලෝග්‍රෑම් 30ක් පමණ දක්වා වර්ධනය වී ඇත. පසුගිය කාලය තුළ දී වාර්ෂික සීනි අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 650,000ක් පමණ වූ අතර, 2023 වර්ෂයේ දී සීනි පරිභෝජනය මෙට්‍රික් ටොන් 661,813ක් දක්වා ඉහළ ගොස් තිබුණි. රටට අවශ්‍ය සීනී ප්‍රමාණයෙන් යම් ප්‍රමාණයක් හෝ සැපයීමට මේ වන විට රට තුළ සක්‍රීයව ක්‍රියාත්මක වන්නේ සීනි කර්මාන්තශාලා 04ක් පමණි. 2023 වසරේ සීනි මෙ.ටො. 66,000ක් පමණ මෙම කර්මාන්තශාලා මගින් නිපදවා ඇති අතර, ඉතිරිය පියවීම සඳහා රු. බිලියන 127ක් පමණ වැය කරමින් එම වසරේ දී සීනි මෙට්‍රික් ටොන් 595,800ක් ආනයනය කර ඇත. හැකි පමණින් දේශීය සීනි නිෂ්පාදනය ඉහළ නැංවීම වෙනුවට, මෙසේ අධික මුදලක් සීනි ආනයනය සඳහා යෙදවීමට සිදු වීම රටේ ආර්ථිකයට අහිතකර ලෙස බලපානු ඇත.

කප්රුකක් බඳු උක් ශාකයෙන්, ප්‍රධාන වශයෙන් සීනි නිෂ්පාදනයට අමතරව Extra Neutral Alcohol (ENA), විදුලි බලය, කොම්පෝස්ට්, බීම වර්ග නිෂ්පාදනයට යොදා ගන්නා පිරිසිදු කරන ලද කාබන්ඩයොක්සයිඩ් වායුව, සම්පීඩිත ජීව වායුව, සුවඳ විලවුන් වර්ග, තිනර්, සනීපාරක්ෂක නිෂ්පාදන, සත්ව ආහාර හා වටිනාකම වැඩි කළ සීනි (උදා: කුරුඳු රසැති සීනි) ආදී අතුරු නිෂ්පාදන බොහෝ ප්‍රමාණයක් නිපදවීමේ විභවයන් පවතී. පසුගිය කාල වකවානුවේ දී සීනි හා ENA වලට තිබූ යහපත් විකුණුම් මිල පදනම්ව, කර්මාන්තශාලා මගින් ගොවීන්ගෙන් මිලදී ගන්නා උක් මෙට්‍රික් ටොන් එකක් සඳහා ගෙවන මුදල රු. 10,000.00ක් දක්වා වැඩිකර, උක් ප්‍රවාහන ගාස්තු ද ඉහළ නංවන ලදී. එනමුත්, මෑතක දී සීනි කිලෝවක මිල (බදු රහිතව) රු. 250.00-275.00 සිට රු. 190.00-210.00 දක්වා අඩුවීමත්, ENA ලීටරයක මිල රු. 1,500.00 සිට රු. 450.00-550.00 දක්වා අඩුවීමත් හේතුවෙන් මේ වන විට දේශීය සීනි කර්මාන්තය බරපතල අර්බුදයකට මුහුණපා ඇත.

**2024 ජනවාරි මාසයේ දී, රජය මුල්වරට හඳුන්වාදුන් නව බදු ප්‍රතිපත්තිය හේතුවෙන් දේශීය සීනි කර්මාන්තයේ අතුරු නිෂ්පාදනයක් වන ENA අලෙවි කර ගැනීමට නොහැකි වීමත්, අලෙවිය සඳහා පැන වූ අගය මත එකතු කළ බද්ද (VAT) හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ද සැළකිය යුතු ලෙස ඉහළ යන ලදී. කෙසේ නමුත් ආනයනික සීනි සඳහා VAT බද්ද අදාළ නොවීමත් ඒ සඳහා කිලෝග්‍රෑම් එකකට රු.50.00ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් (SCL) පමණක් අය කිරීමත් දේශීය නිෂ්පාදකයා මුළුමනින්ම අධෛර්යමත් කරවන හේතුවක් විය.**

එහි ප්‍රතිඵලයක් ලෙස ආනයනික සීනි කිලෝග්‍රෑමයක මිල හා සැසඳීමේ දී දේශීය සීනි කිලෝග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය, 2.5%ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) හා 18%ක VAT බද්ද එකතු වූ පසු සැලකිය යුතු අගයකින් ඉහළ ගොස් ඇත. මෙම අර්බුදකාරී වාතාවරණය මෙන්ම, ගෝලීය සුදු සීනි මිල පහත වැටීම, ඇමරිකානු ඩොලර් විනිමය අනුපාතය පහත වැටීම මෙන්ම ඉහතින් සඳහන් කළ මෑතක දී හඳුන්වා දුන් බදු ප්‍රතිපත්ති ඇතුළු සංකීර්ණ තත්වයන් හරහා දේශීය සීනි නිෂ්පාදකයා අස්ථාවර දිශානතියකට ගමන් කරමින් සිටි. තවද, සුදු සීනි අත්‍යවශ්‍ය භාණ්ඩයක් ලෙස ද දුඹුරු සීනි අත්‍යවශ්‍ය නොවන භාණ්ඩයක් ලෙසද වර්ග කර තිබීම ද ප්‍රශ්නගත තත්වයකි. මීට අමතරව අමුද්‍රව්‍යක් ලෙස බඩඉරිඟු භාවිතා කර නිපදවන ENA දේශීය වෙළඳපොළට පැමිණීම ද විශාල ගැටලුකාරී තත්වයකි.

**දේශීය සීනි කිලෝග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය, 2.5% ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) හා 18% ක වැට් බද්ද එකතු වූ පසු සැලකිය යුතු අගයකින් මිල ඉහළ ගොස් ඇත.**

සීනි සහ ENA මිල පහත වැටුණ ද කර්මාන්තයේ නියැලී සිටින ගොවීන් සඳහා උක් ටොන් එකක් සඳහා ගෙවන මිල අඩු කිරීම කළ නොහැකි අතර, එම මූල්‍යමය වෙනස මෙම සීනි නිෂ්පාදන ආයතන විසින් දරාගැනීම හැර වෙනත් විකල්පයක් නොමැත.
තවද, නිෂ්පාදන පිරිවැය හා විදේශ විනිමය අනුපාතයේ අසමතුලිතතාව සීනි කර්මාන්තායතනවලට දරා ගැනීමට සිදුව ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ආයතනවල මූල්‍ය අර්බුදය තව තවත් උත්සන්න වී ඇත. මේ සඳහා රජය සෘජුවම මැදිහත් වී කඩිනමින් ක්‍රියාමාර්ග නොගතහොත් සීනි නිෂ්පාදන කර්මාන්තයේ අනාගතය ඉතා අවිනිශ්චිත වනු ඇත. එමගින් දේශීයව සිදු කරන නිෂ්පාදනය රටට අහිමි වනවා පමණක් නොව උක් ගොවියා ඇතුළු මෙම කර්මාන්තය ආශ්‍රිතව බිහිව ඇති 250,000 කට අධික සෘජු හා වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් අස්ථාවර වනු ඇත.

**දේශීය සීනි නිෂ්පාදනයට කන කොකා හඬලන මෙවන් යුගයක අතීතයේ වැසී ගිය සීනි කර්මාන්තයේ අඳුරු පැතිකඩ යළි යළිත් සිහිවෙමින් පවතී. එදා එහි ප්‍රතිඵලයක් වූ දේශීය නිෂ්පාදනයට සක්‍රීය දායකත්වයක් දැක් වූ කන්තලේ සීනි කර්මාන්තශාලාව අදටත් දිරාපත් වෙමින් පවතී. දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම වර්තමාන රජයේ මූලික අරමුණක් වී ඇති බැවින්, දේශීය උක් කර්මාන්තය ආරක්ෂාකර එහි තිරසාර පැවැත්මට අවශ්‍ය මූලික අඩිතාලම දමනු ඇතැයි අපි වර්තමාන රජයෙන් බලාපොරොත්තු වන්නෙමු.**

01 පිටුවෙන්

## උක් පර්යේෂණ ආයතනයට කෘෂිකාර්මික පර්යේෂණ විශිෂ්ඨතා සම්මානයක්

උක් පර්යේෂණ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ආචාර්ය අරුණ විජේසූරිය, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී මාලිකා පෙරේරා, පර්යේෂණ නිලධාරී ආචාර්ය සුමේධා තුෂාරි හා රබර් පර්යේෂණ ආයතනයේ ආචාර්ය වාසනා විජේසූරිය යන පර්යේෂණ කණ්ඩායම විසින් සිදු කරන ලද "ඉහළ අස්වැන්නක් සහ ඉහළ රෝග ප්‍රතිරෝධීතාවක් සහිත නව උක් ප්‍රභේද නිපදවීම සඳහා සුදුසු දෙමාපියන් හඳුනා ගැනීම" යන පර්යේෂණය 2021 වර්ෂයට අදාළව වැවිලි අංශයේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට සමත් විය. මෙම පර්යේෂණය උක් ප්‍රභේද සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද පර්යේෂණයක් වන අතර, මෙම පර්යේෂණයට අවශ්‍ය ප්‍රතිපාදන සැපයීම, ජාතික කෘෂිකර්ම පර්යේෂණ සභාව විසින් සිදු කර ඇත. මෙම පර්යේෂණය උක් පර්යේෂණ ආයතනයේ බෝග වැඩිදියුණු කිරීමේ අංශය, බෝග ආරක්ෂණ අංශය ඇතුළු පර්යේෂණ අංශවල දායකත්වය ඇතිව 2015 සිට 2019 දක්වා ක්‍රියාත්මක කරන ලද සාර්ථක පර්යේෂණයක් ලෙස හැඳින්විය හැකිය.

# උක් වගා තාක්ෂණයන් ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් රැසක්

ඩී. පී. ඩබ්ලිව්. පොත්තවෙල - කාර්යභාර තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී



උක් වගාවේ යාන්ත්‍රීකරණ තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගිකව දැනුම ලබා දෙමින්

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ බෝග තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ උපාධි පාඨමාලාව හදාරන සිසුන් කණ්ඩායමක් වෙනුවෙන් විෂයානුබද්ධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් දෙදින අධ්‍යාපනික වැඩසටහනක් 2024 සැප්තැම්බර් 05 හා 06 යන දිනවල උක් පර්යේෂණ ආයතනයේ දී පැවැත්විණි. උක් වගාව සංස්ථාපනය කිරීමේ සිට අස්වැන්න නෙළීම දක්වා ක්ෂේත්‍රයේ සිදු කරන ප්‍රායෝගික ක්‍රියාකාරකම්, උක් කර්මාන්තය ආශ්‍රිත අතුරු නිෂ්පාදන මෙන්ම යාන්ත්‍රීකරණ තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබා දීමට උක් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ අංශ සමග තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය එක්ව පියවර ගැනිණ.



උක් වගාවේ ශෂ්‍ය විද්‍යාත්මක පාලන කටයුතු පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබා දෙමින්

කොළඹ විශ්වවිද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යාතනයේ තෙවෙනි වසර සිසුන් වෙනුවෙන් උක් වගාවේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් අධ්‍යාපනික වැඩසටහනක් 2024 සැප්තැම්බර් 22 දින සියලු පර්යේෂණ අංශ මෙන්ම තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශයේ දායකත්වය ඇතිව උක් පර්යේෂණ ආයතනයේ දී පැවැත්විය. උක් වගාව සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් ආවරණය කරමින් ප්‍රායෝගික දැනුම ලබා දීමට පියවර ගැණින.



උක් වගාවේ තවාන් පාලනය හා බීජ සිටුවීම පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබා දෙමින්

රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ තෙවෙනි වසර සිසුන් වෙනුවෙන් උක් වගාවේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් අධ්‍යාපනික වැඩසටහනක් 2024 නොවැම්බර් 18 දින උක් පර්යේෂණ ආයතනයේ දී පැවැත්විය. උක් වගාවේ බිම් සැකසීම, තවාන් පාලනය, බීජ සිටුවීම, රෝග හා පළිබෝධ පාලනය හා අස්වනු නෙළීම ආශ්‍රිතව සිදු කරනු ලබන ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම මෙහිදී සිසුන් වෙත ලබා දෙන ලදී.



පාසල් දරුවන් උක් පර්යේෂණ ආයතනයේ ප්‍රදර්ශන කුටිය නැරඹීමට එක්වෙමින්

## දක්ෂිණ කෘෂි නවෝදය - 2024 - කෘෂිකාර්මික, අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනය

දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජල සම්පාදන හා ජලාපවාහන, ආහාර සැපයීම හා බෙදා හැරීම, වෙළඳ සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ලබුදූව රජයේ කෘෂි ගොවිපොළ පරිශ්‍රය කේන්ද්‍රකොට 2024 නොවැම්බර් 20 සිට 24 දක්වා පවත්වන ලද කෘෂිකාර්මික ප්‍රදර්ශනයට උක් පර්යේෂණ ආයතනය මගින් ද ප්‍රර්ශන කුටියක් එක්කර තිබිණි. මෙම ප්‍රදර්ශන කුටිය මගින් උක් පර්යේෂණ ආයතනය විසින් පාර්ශවකරුවන් වෙත ලබා දෙන විවිධ සේවාවන් පිළිබඳ දැනුවත් කිරීමටත් ඊට අදාළ තොරතුරු පත්‍රිකා බෙදා හැරීමටත් පියවර ගෙන තිබුණි. එමෙන්ම ප්‍රදර්ශන කුටිය නරඹන්නන් සඳහා උක් යුෂ කෝප්පයක රසය විඳීමටත් පිරිසිදු උක් හකුරු මිලට ගැනීමටත් අවස්ථාව සලසා දී තිබුණි. උක් පර්යේෂණ ආයතනයේ තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශයේ කාර්යමණ්ඩලය දින පහ මුළුල්ලේම මෙම ප්‍රදර්ශනය සාර්ථක කරගැනීමට මහත්වූ දායකත්වයක් ලබා දීමට කටයුතු කළහ.



පුහුණු වැඩසටහන සඳහා නිලධාරීන් සහභාගී වෙමින්

සියඹලාණ්ඩුව උක් වගා සංවර්ධන නිලධාරී කාර්යාලය මගින් සංවිධානය කළ පුහුණු වැඩසටහනක් 2024 නොවැම්බර් 27 දින ඇතිමලේ වැව්ලි සමාගමේ, පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. මේ සඳහා එම සමාගමේ පිටස්තර ගොවි අංශයේ නිලධාරීන් පිරිසක් එක් විය. උක් වගාවේ නිවැරදි ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රමවේදයන් පිළිබඳ ආවරණය කරමින් මෙහිදී දැණුම ලබා දීමට පියවර ගෙන තිබිණ. ඇතිමලේ වැව්ලි පුද්ගලික සමාගම මෙම වැඩසටහන සඳහා අනුග්‍රහය ලබා දෙන ලදී.

## දේශීය ආහාර ප්‍රදර්ශනය හා අලෙවිය




ප්‍රදර්ශන කුටිය නැරඹීමට නිලධාරීන් සහභාගී වෙමින්

සෞඛ්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශය මගින් දේශීය ආහාර සංස්කෘතිය ජනගත කිරීම, දේශීය ආහාර හා හෙළ වෙදකම් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම යන අරමුණු පෙරදැරි කර ගනිමින් 2024 නොවැම්බර් 22 දින සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සංවිධානය කරන ලද මෙම ප්‍රදර්ශනය සෙවනගල මහා විද්‍යාල භූමියේ දී පැවැත්වූ අතර, මේ සඳහා උක් පර්යේෂණ ආයතනයේ දායකත්වය ද ප්‍රදර්ශන කුටියකින් ලබා දී තිබුණි. උක් පර්යේෂණ ආයතනයේ සැකසුම් තාක්ෂණ අංශය උක් කර්මාන්තය ආශ්‍රිත අතුරු නිෂ්පාදනයන් පිළිබඳ දැනුවත් කිරීමට මෙහිදී පියවර ගැනිණි. එමෙන්ම මෙම ප්‍රදර්ශන කුටිය නරඹන්නන් සඳහා උක් ශාකය උපයෝගී කර ගනිමින් සිදු කළ හැකි විවිධ නිෂ්පාදනයන් පිළිබඳ තොරතුරු හා ඒවා දැක බලා ගැනීමේ අවස්ථාව ද උදාකර දී තිබිණි. උක් පර්යේෂණ ආයතනයේ සැකසුම් තාක්ෂණ අංශයේ කාර්යමණ්ඩලය විසින් මෙම ප්‍රදර්ශන කුටිය පවත්වාගෙන යාමට සිය උපරිම දායකත්වය ලබා දුනි.

# 'උක් වගාව උතුරට' වැඩසටහන තවත් පියවරකින් ඉදිරියට

පී. ඒ. ඒ. චතුරංග - පර්යේෂණ නිලධාරී



ආනෙවිලුඳාන් උක් හකුරු නිෂ්පාදන මධ්‍යස්ථානය

උක් පර්යේෂණ ආයතනය විසින් **"උක් වගාව උතුරට"** වැඩසටහන, උතුරු පළාතේ යුද්ධයෙන් පීඩාවට පත් ජනතාවගේ ජීවන තත්වය නගාසිටුවීමේ අරමුණින් 2010 වර්ෂයේ දී නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කළ අතර, කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණය යටතේ මෙහෙයවීම සිදුවිය.

මීට අදාළ මූලික පර්යේෂණ කටයුතු උක් පර්යේෂණ ආයතනය විසින් කිලිනොච්චි කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ දී සිදු කළ අතර, එහිදී ප්‍රදේශයේ දේශගුණික තත්වයන්ට ගැලපෙන උක් ප්‍රභේද හඳුනාගෙන ඇත.

ප්‍රදේශයේ උක් වගාව ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය බීජ උක් නිපදවීම සඳහා 2015 දී වන්නේරිකුලම් ප්‍රදේශයේ බීජ උක් තවානක් ස්ථාපිත කරන ලද අතර, එමගින් නිෂ්පාදිත නිරෝගී බීජ උක් ප්‍රදේශයේ ගොවීන් වෙත හඳුන්වා දෙමින් උක් වගාව ව්‍යාප්ත කර ඇත. මේ සඳහා අවශ්‍ය මූලික යෙදවුම්, අවශ්‍ය යන්ත්‍රෝපකරණ සැපයීම මෙන්ම තාක්ෂණික දැනුම උක් පර්යේෂණ ආයතනය විසින් ද, සැකසුම් ඒකකය ඉදිකිරීම වෙනුවෙන් වැයවන මුදල් ප්‍රතිපාදන කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ද සපයා ඇත.

මෙම සැකසුම් ඒකකයේ මෙහෙයවීම හා උක් වගා කිරීමේ කටයුතු උක් ගොවි සංවිධානය විසින් සිදු කළ අතර, 2024 නොවැම්බර් මස සිට මෙම නිෂ්පාදන ඒකකයේ කටයුතු වඩාත් කාර්යක්ෂමව පවත්වාගෙන යාම වෙනුවෙන් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව



2024.11.22 දින නිලධාරීන් හා ප්‍රදේශවාසීන් උත්සවයට පිළිගනිමින්


2024.11.22 දින උක් හකුරු නිෂ්පාදන කටයුතු උත්සවාකාරයෙන් ආරම්භ කරමින්

ව්‍යාපෘතියක් ලෙස පුද්ගලික ව්‍යවසායක ආයතනයක් වන Natural Roots සමග ඒකාබද්ධව නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළ ඉලක්ක කරගත් නිෂ්පාදන සිදු කිරීමේ අරමුණින්, එහි නිෂ්පාදන කටයුත 2024.11.22 දින උත්සවාකාරයෙන් ආරම්භ කළ අතර, මේ සඳහා උක් පර්යේෂණ ආයතනය නියෝජනය කරමින් වැඩබලන අධ්‍යක්ෂ හා බෝග හා සම්පත් කළමනාකරණ අංශයේ කාර්යභාර පර්යේෂණ නිලධාරි සහභාගී වූ අතර, කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම්, කරච්චි ප්‍රාදේශීය ලේකම්, Narural Root ආයතන නිලධාරීන්, උතුරු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ, යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පීඨාධිපති, සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, සහකාර අධ්‍යක්ෂ (අපනයන සංවර්ධන මණ්ඩලය-උතුරු පළාත), සහකාර අධ්‍යක්ෂක (කුඩා ව්‍යාපාර සංවර්ධන-කිලිනොච්චි), සහකාර අධ්‍යක්ෂක (කාර්මික සංවර්ධන මණ්ඩලය- කිලිනොච්චි) යන නිලධාරීන් සහභාගී විය.

මෙම ව්‍යාපෘතිය උක් පර්යේෂණ ආයතනයේ බෝග හා සම්පත් කළමනාකරණ අංශයේ මෙහෙයවීම යටතේ සිදුකරනු ලබන අතර අදාළ තාක්ෂණික කටයුතු සැකසුම් තාක්ෂණ අංශය, යාන්ත්‍රිකරණ තාක්ෂණ අංශය හා නඩත්තු අංශය ඒකාබද්ධව ද, පුහුණු කටයුතු තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය මගින් ද සිදුකරනු ලබයි.

# චීන - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ ප්‍රකාශනයක්



උක් පත්‍ර ප්‍රදාහය (Sugarcane Leaf Scald Disease -LSD) උක් වගාවේ හඳුනා ගත හැකි ප්‍රධාන බැක්ටීරියා රෝගයකි. ක්‍රමයෙන් ඉහළ යන ගෝලීය සීනි පරිභෝජනය හමුවේ මනා රෝග කළමනාකරණයක් සමග උක් වගා පාලනය තුළින් නිෂ්පාදන කාර්යක්ෂමතාව උපරිම ලෙස පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය කරුණකි. රෝග කළමනාකරණයේ දී ප්‍රතිරෝධී උක් ප්‍රභේද සඳහා විශේෂ ස්ථානයක් හිමි වේ. ප්‍රතිරෝධී උක් ප්‍රභේද නිෂ්පාදනය උක් අභිජනකයින් විසින් මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් වන අතර, ඒ සඳහා සුදුසු දෙමාපිය දර්ශ හඳුනා ගැනීමට අදාළ පර්යේෂණ අඛණ්ඩව ලොව පුරා ඇති පර්යේෂණ ආයතන මගින් සිදු කරමින් පවතී.

ශ්‍රී ලංකා උක් පර්යේෂණ ආයතනය හා චීනයේ යුනාන් උක් පර්යේෂණ ආයතනය අතර පවත්වාගෙන යනු ලබන ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහනට සමගාමීව බෝග වැඩිදියුණු කිරීමේ අංශයේ පර්යේෂණ නිලධාරී කේ.පී. වික්‍රමසිංහ, යුනාන් උක් පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින් හා එක්ව උක් පර්යේෂණ හා කළමනාකරණ කටයුතු සඳහා ඉතා වැදගත් පර්යේෂණ සමාලෝචන පත්‍රිකාවක් සකස් කරන ලද අතර, එය, 'Multidiciplinary Digital Publishing Institute (MDPI)' මගින් පවත්වාගෙන යනු ලබන *'Plants'*

*plants* MDPI

*Review*

**Recent Advances in Sugarcane Leaf Scald Disease: Pathogenic Insights and Sustainable Management Approaches**

**Chun-Yan Kong [1,*], Kamal Priyananda Wickramasinghe [1,2], Chao-Hua Xu [1], Jun Mao [1], Hong-Bo Liu [1], Tanweer Kumar [1,3], Xiu-Qin Lin [1], Xu-Juan Li [1], Chun-Yan Tian [1], Pei-Fang Zhao [1] and Xin Lu [1,*]**

1 National Key Laboratory for Tropical Crop Breeding, Sugarcane Research Institute, Yunnan Academy of Agricultural Sciences, Yunnan Key Laboratory of Sugarcane Genetic Improvement, Kaiyuan 661699, China
2 Sugarcane Research Institute, Uda Walawe 70190, Sri Lanka
3 Sugar Crops Research Institute, Agriculture, Fisheries and Co-Operative Department, Charsadda Road, Mardan 23210, Khyber Pakhtunkhwa, Pakistan

අන්තර්ජාතික විද්‍යාත්මක ප්‍රකාශන සඟරාව මගින් ප්‍රසිද්ධ කර ඇත. උක් වගාවේ පත්‍ර ප්‍රදාහය සම්බන්ධ මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් ලොව පුරා හඳුනාගෙන ඇති ප්‍රතිරෝධී උක් ප්‍රභේද, රෝග චක්‍රය, රෝගය සඳහා බලපාන පාරිසරික සාධක, රෝග පළිබෝධ අන්තර් ක්‍රියා මෙන්ම ඒකාබද්ධ රෝග පාලනය සම්බන්ධ තොරතුරු සහ අනාගත පර්යේෂණ අවශ්‍යතාවන් ඇතුළත් තොරතුරු රාශියක් සමාලෝචනය කර ඇත. උක් වගාව සම්බන්ධ පර්යේෂණවල යෙදෙන්නන් මෙන්ම කළමනාකරුවන් වෙත ද වැදගත් තොරතුරු රාශියක් මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් ලබා ගත හැකි අතර, එය <u>*https://doi.org/10.3390/plants14040508*</u> යොමුව ඔස්සේ බාගත කර ගත හැකිය.

# ඉතිහාසයේ දෙවන ඉහළම දේශීය සීනි නිෂ්පාදනය 2024 වසරේ දී...

**දිනේශ් කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී**

2024 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තයේ කාර්යසාධනය සලකා බැලීමේ දී 2021 වසරට පසු ඉහළම සීනි නිෂ්පාදනය, එනම් මෙට්‍රික් ටොන් 80,678ක් වාර්තා විය. එය 2023 වසරේ නිෂ්පාදනයට වඩා 22%ක පමණ වැඩි වීමකි.

විශේෂයෙන් ගල්ඔය හා ඇතිමලේ සීනි කර්මාන්තශාලාවල සීනි නිෂ්පාදනයේ සිදු වී ඇති කැපී පෙනෙන වැඩිවීම මේ සඳහා දායක වී ඇත (වගුව 01 - පිටුව 08). එම කර්මාන්තශාලාවල අඹරන ලද උක් ප්‍රමාණයේ වැඩි වීම මේ තත්වයට ප්‍රධානව බලපා ඇත. එහෙත් ලංකා සීනි සමාගමට අයත්, සෙවනගල හා පැල්වත්ත කර්මාන්තශාලාවල සීනි නිෂ්පාදනය 2023 වසරට සාපේක්ෂව සුළු අඩු වීමක් පෙන්නුම් කරයි. සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය සැලකීමේ දී ද සෙවනගල කර්මාන්තශාලාවේ යම් අඩුවීමක් දක්නට ලැබේ.



උක් වගා කරන ලද බිම් ප්‍රමාණයේ හෙක්ටයාර 300ක පමණ වැඩි වීම කෙරෙහි ගල්ඔය හා ඇතිමලේ කර්මාන්තශාලාවලට අයත් බල ප්‍රදේශවල වැඩි වීම දායක වී ඇත. 2023 වසරේ පැවති නියඟයට සාපේක්ෂව හිතකර කාලගුණ තත්වයක් පැවතීම හේතුවෙන් 2024 වසරේ දී සෑම ප්‍රදේශයකම සාමාන්‍ය උක් අස්වැන්නෙහි වැඩි වීමක් දක්නට ලැබේ. වගාබිම් ප්‍රමාණයේ මෙන්ම උක් අස්වැන්නෙහි වැඩි වීම ද හේතු කොට ගෙන අඹරන ලද උක් ප්‍රමාණය 2024 වසරේ දී 2023 ට වඩා 23% කින් පමණ වැඩි වී ඇත. එහෙත් 2023 වසරේ සිට පැවත එන අළෙවිකර ගැනීමේ ගැටලු හේතුවෙන් සමස්ත එතනෝල් නිෂ්පාදනය 3% කින් පමණ අඩු වී ඇත.

ආනයනික සුදු සීනිවලට සාපේක්ෂව දේශීයව නිපදවන සීනි මත පනවා ඇති අවාසිදායක බදු යටතේ සාධාරණ මිලකට සීනි අළෙවි කර ගැනීමේ ගැටලු හමුවේ වුවද සීනි නිෂ්පාදනයේ මෙම ප්‍රගතිය පැසසිය යුතුය. එසේම උක් වගාව හා රුපියල් බිලියන 31ක පමණ වටිනාකමින් යුතු සීනි, එතනෝල්, විදුලිබලය හා කොම්පෝස්ට් වැනි උක් ආශ්‍රිත නිෂ්පාදන හරහා ද රැකියා උත්පාදනය හා ආනයන ආදේශනය මගින් ද ලංකාවේ ආර්ථිකයට දක්වා ඇති දායකත්වය සැලකිල්ලට ගෙන උක් කර්මාන්තය රැකගැනීමට හා සංවර්ධනයට උපරිම දායකත්වය ලබා දීම සියලු පාර්ශවකරුවන්ගේ වගකීමක් වේ.

08 පිටුවට

07 පිටුවෙන්

# ඉතිහාසයේ දෙවන ඉහළම දේශීය සීනි නිෂ්පාදනය 2024 වසරේ දී...

**2024 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තයේ කාර්යසාධනය සලකා බැලීමේ දී 2021 වසරට පසු ඉහළම සීනි නිෂ්පාදනය, එනම් මෙට්‍රික් ටොන් 80,678 ක් වාර්තා විය. එය 2023 වසරේ නිෂ්පාදනයට වඩා 22% ක පමණ වැඩි වීමකි.**

වගුව 01 - 2018 සිට 2024 දක්වා දේශීය උක් කර්මාන්තයේ කාර්යසාධනය

| වර්ෂය | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|
| දේශීය සීනි නිෂ්පාදනය (මෙ.ටොන්) | 51,265 | 52,304 | 60,678 | 81,641 | 78,870 | 66,013 | 80,678 |
| සෙවනගල | 14,709 | 16,013 | 16,071 | 17,796 | 12,628 | 13,623 | 11,920 |
| පැල්වත්ත | 28,061 | 25,162 | 23,582 | 30,300 | 24,110 | 28,077 | 27,791 |
| ගල්ඔය | 8,495 | 11,129 | 20,790 | 22,628 | 28,567 | 14,581 | 26,382 |
| ඇතිමලේ | - | - | - | 10,917 | 13,565 | 9,732 | 14,585 |
| සීනි උකහා ගැනීම (Recovery %) | | | | | | | |
| සෙවනගල | 6.59 | 6.90 | 6.57 | 5.90 | 5.34 | 6.03 | 5.40 |
| පැල්වත්ත | 7.55 | 7.61 | 7.30 | 6.70 | 7.03 | 6.97 | 7.02 |
| ගල්ඔය | 6.78 | 7.06 | 6.58 | 6.34 | 7.18 | 6.43 | 6.46 |
| ඇතිමලේ | - | - | - | 7.62 | 7.81 | 6.73 | 6.49 |
| වගාකරන ලද භූමි ප්‍රමාණය (හෙක්.) | 14,393 | 162,08 | 17,368 | 24,377 | 25,476 | 26,540 | 26,866 |
| සෙවනගල | 3,502 | 3,240 | 3,385 | 3,305 | 3,552 | 3,959 | 3,481 |
| පැල්වත්ත | 7,810 | 7,810 | 8,133 | 9,713 | 9,913 | 9,466 | 9,385 |
| ගල්ඔය | 3,081 | 5,158 | 5,850 | 6,570 | 6,837 | 7,397 | 7,868 |
| ඇතිමලේ | - | - | - | 4,789 | 5,174 | 5,718 | 6,132 |
| උක් අස්වැන්න (හෙක්./මෙ.ටොන්) | | | | | | | |
| සෙවනගල (වාරි/වර්ෂා) | 110/71 | 105/66 | 101/61 | 114/82 | 110/84 | 86/66 | 96/72 |
| පැල්වත්ත | 47 | 40 | 39 | 61 | 50 | 42 | 45 |
| ගල්ඔය | 52 | 67 | 54 | 65 | 53 | 48 | 60 |
| ඇතිමලේ | - | - | - | 50 | 40 | 32.5 | 39 |
| අඹරන ලද උක් දඬු ප්‍රමාණය (මෙ.ටොන්) | 720,260 | 790,213 | 879,563 | 1,290,069 | 1,279,519 | 1,010,867 | 1,247,551 |
| සෙවනගල | 223,293 | 232,791 | 244,457 | 301,767 | 237,541 | 232,068 | 220,909 |
| පැල්වත්ත | 371,694 | 330,824 | 323,106 | 488,168 | 343,038 | 402,813 | 396,125 |
| ගල්ඔය | 125,273 | 226,598 | 312,000 | 356,647 | 397,751 | 231,350 | 408,099 |
| ඇතිමලේ | - | - | - | 143,487 | 176,599 | 144,636 | 222,418 |
| ENA නිෂ්පාදනය (ලීටර් මිලියන) | 13.00 | 12.50 | 14.40 | 20.12 | 21.63 | 13.35 | 12.90 |
| සෙවනගල | 4.20 | 2.20 | 3.30 | 5.10 | 3.90 | 2.50 | 1.20 |
| පැල්වත්ත | 5.50 | 5.60 | 5.50 | 7.96 | 7.88 | 5.02 | 3.91 |
| ගල්ඔය | 3.30 | 4.70 | 5.60 | 7.06 | 6.90 | 3.93 | 5.60 |
| ඇතිමලේ | - | - | - | - | 2.95 | 1.90 | 2.19 |


**උපදේශකත්වය**
එම්. විකසිත පුෂ්පසූරිය - සභාපති
ආචාර්ය ඒ. එල්. සී. ද සිල්වා - අධ්‍යක්ෂ(වැ.බ.)

**සංස්කාරක මණ්ඩලය**
ඩී. පී. ඩබ්ලිව්. පොත්තවෙල - තාක්‍ෂණ සම්ප්‍රේෂණ නිලධාරී
කේ. ඒ. දිනේශ් කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරී
ඒ. එන්. එම්. බී. රසික ප්‍රභාත් - සංවර්ධන නිලධාරී

**පිටු සැකසුම හා නිර්මාණකරණය**
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරී

**ලිපි සහ තොරතුරු සැපයීමෙන් දායකත්වය**
ඩී. පී. ඩබ්ලිව් පොත්තවෙල - තාක්‍ෂණ සම්ප්‍රේෂණ නිලධාරී
දිනේශ් කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
සුරත් පෙරේරා - ප්‍රධාන විධායක නිලධාරී (ගල්ඔය වැවිලි සමාගම)
ඒ. එම්. මාලිකා පෙරේරා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
කේ.පී. වික්‍රමසිංහ - පර්යේෂණ නිලධාරී
පී.ඒ.ඒ. චතුරංග - පර්යේෂණ නිලධාරී
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරී
මධුරංග සම්පත් වේරගොඩ - සංවර්ධන නිලධාරී
ඒ. එන්. එම්. බී. රසික ප්‍රභාත් - සංවර්ධන නිලධාරී





**සංස්කාරක**
පුවත් හසුන
උක් පර්යේෂණ ආයතනය
උඩවලව
ඊමේල්: puwathhasunasri@gmail.com

**විමසීම්**
අධ්‍යක්ෂ, උක් පර්යේෂණ ආයතනය, උඩවලව
දුරකථන: 047 22 33281, 047 22 33285 ෆැක්ස්: 047 22 33233
ඊ මේල්: puwathhasunasri@gmail.com
වෙබ් අඩවිය: www.sugarres.lk


Follow us on

**ප්‍රකාශනය - තාක්‍ෂණ හුවමාරු හා සංවර්ධන අංශය - උක් පර්යේෂණ ආයතනය**